අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/2/1

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.12. 26

**චක්‍ර ලේඛ අංක : 43 / 2018**

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියළුම පළාත් අධ්‍යාපන අධක්ෂවරුන්,

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියළුම විදුහල්පතිවරුන් වෙත.

**<u>සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2019</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව මගින් පවත්වනු ලබන උක්ත තරගය 2019 වර්ෂය සඳහා ද පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් , ඒ පිළිබඳව ඔබ පළාතේ / කලාපයේ සියළුම පාසල්වල විදුහල්පතිවරුන් , අදාළ ගුරු භවතුන් සහ ශිෂ්‍ය /ශිෂ්‍යාවන් දැනුවත් කරන මෙන් මෙයින් දන්වමි.

පද්මසිරි ජයමාන්න
ලේකම් ,
අධ්‍යාපන අමාත්‍යාංශය

# සමස්ත ලංකා පාසල් නර්තන තරග චක්‍රලේඛය - 2019

# චක්‍රලේඛ අංකය - ( 43 / 2018 )

හැඳින්වීම.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 1970 වර්ෂයේ සිට මේ දක්වා දිවයිනේ සියළුම පාසල්වල නර්තන ගුරු භවතුන්ගේ හා විෂයය හදාරන සිසු දරුවන්ගේ කුසලතා සහ ආකල්ප සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය සඳහාත්, මෙම තරගය සංවිධානය කර පවත්වනු ලැබේ. මෙම තරගය මගින් එක් වසරකට සිසුන් 40,000 ක් පමණ තම ප්‍රතිභාව ප්‍රදර්ශනය කරන අතර,අදාල ගුරු භවතුන් තම නිර්මාණ කුසලතා වර්ධනය සඳහා මනා වූ පිටුවහලක්ද ලබා ගනී.

වසරින් වසරට නව ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පවත්වනු ලබන මෙම තරගය නිසා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථවත් වේ. විෂයය නිර්දේශය අර්ථවත්ව පවත්වාගනයාම සඳහාත් ඉමහත් මෙහෙවරක් කරනු ලබන මෙම තරගය ගුරුභවතුන්ගේ සහයෝගය සහ සුහදතාවය සංවර්ධනය කරන තරගයක් බවට ද පත්වී ඇත.

ජය පරාජය සමසේ බෙදා ගැනීමේ උතුම් වූ මානවීය ගුණාංග සංවර්ධනය කරනු ලබන මෙම තරගය විශ්ව විද්‍යාලය ප්‍රවේශය සඳහා ළමුන්ගේ ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය කිරීමටද හේතු වේ.

## තරගය පිළිබඳ පොදු නීති රීති.

01. පාසල් වර්ග පහතින් දැක්වේ.

1. සිසුන් 1000 ට වැඩි පාසල්
2. සිසුන් 301- 1000 දක්වා පාසල්
3. සිසුන් 300 හා 300 ට අඩු පාසල්
4. ජාත්‍යන්තර පාසල්

02. සහභාගීත්වය

02.01. විශේෂයෙන්ම නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදෙන පාසල් මෙම තරගයට අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය. සහභාගී නොවන්නේනම් තම පාසල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කල යුතු අතර, ඉදිරිපත් නොවන පාසල් පිළිබඳ සත්‍ය වාර්තාවක් කලාප තරග පැවැත්වීමෙන් පසු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. අදාල පාසලේ ගුරුභවතුන් විසින්ම නිර්මාණය හා පුහුණුවීම් කළ යුතු අතර, බාහිර සම්පත්දායකයන් යොදවා ගැනීම සපුරා තහනම්ය. එහෙත් අදාල අධ්‍යාපන කලාපයේ / පළාතේ ගුරු උපදේශකවරුන්ගේ සහ අධ්‍යක්ෂකවරුන්ගේ සහාය ලබා ගත හැකිය. නර්තන ගුරු භවතුන් සේවයෙහි යෙදී සිටින පාසල් වලට ස්වේච්ඡා ගුරු භවතුන් යොදා ගත නොහැක. නර්තන ගුරු භවතෙකු නොමැති පාසල් වලට ස්වේච්ඡා ගුරු භවතුන්ගේ සේවය ලබා ගත හැකිය. අදාල ස්වේච්ඡා ගුරුභවතා අවම වශයෙන් වසර දෙකක්වත් එම පාසලේ සේවය කළ බවට අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර තිබිය යුතුය. (අවශ්‍ය අවස්ථාවන්හිදී ලොග් සටහන් පිටපත් හා පැමිණීමේ ලේඛණ ඉදිරිපත් කළ යුතුය.)

## 03. තරගය සඳහා ඇඳුම් පැළඳුම්

03.01. කලාප ,පළාත් සහ සමස්ත ලංකා අවසන් තරග සඳහා පුහුණු ඇඳුම් කටවිටලයෙන් පමණක් නර්තන අංග හා වාදන ඉදිරිපත් කළ යුතුය. ශිෂ්‍යාවන්ගේ සාය තනි වර්ණයෙන් විය යුතු අතර. උඩුකය සඳහා ලියෝටාඩ් / හැට්ටයද, කළු පිජාමා කලිසමද, භාවිතා කළ යුතුය. පිරිමි ළමුන් සඳහා කළු පාට අත්කොට බැනියම (ස්කිනියර්) සහ දණහිසට අගල් 05 ක් පමණ උසින් යුක්ත තනි පාට ඉණ රැල්ලද කළු පිජාමා කලිසම ද භාවිතා කළ යුතුය. පළාත් කලාප තරග සඳහා සහභාගී වන්නන්ගේ ඇඳුම සම්බන්ධව ගැටළු සහගත අවස්ථාවකදී තීරණ ගැනීම අදාල පළාතේ /කලාපයේ නර්තන විෂයය භාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ මත කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකල යුතුය. මෙහිදී නර්තන හැකියාව කෙරෙහි වඩා සැළකිල්ලට ගෙන වඩාත් දක්ෂ කණ්ඩායම අවසාන වටයට එවීමට කටයුතු කළ යුතුය.

03.02. සිලම්බු භාවිතා කළ හැක.

03.03. තරගය සඳහා ඉදිරිපත්වන දරුවන් සහ ගුරු භවතුන් පාසලේ අනන්‍යතාවය හෙළිවන ආකාරයේ ඇඳුම් පැළඳුම හෝ වෙනත් දේ භාවිතා නොකළ යුතුය.

## 04. සහභාගී සංඛ්‍යාව සඳහා උපදෙස්.

- ඒකල වාදන තරග අංග හැර සියළුම ඒකල නර්තන සඳහා සහභාගීවිය හැක්කේ ගායන වාදන සමග උපරිම මුළු සංඛ්‍යාව 05 කි.
- මුද්‍රානාට්‍ය අංග හැර සියළුම නර්තන තරග සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව නර්තනය සඳහා 16 කි. අවම සංඛ්‍යාව 06 කි. සහාය ගායන වාදන සඳහා උපරිම සංඛ්‍යාව 08 කි. මුළු සංඛ්‍යාව උපරිම 24 කි.
- මුද්‍රා නාට්‍ය සඳහා වාදනය සමග සහභාගීත්වය උපරිම සහභාගීත්වය 30 කි.
- ඒකල /යුගල චරිත නිරූපණය සඳහා සහාය වාදනය උපරිම සංඛ්‍යාව 08 කි.
- ඒකල වාදනය සඳහා සහාය වාදනයෙන් සහාය විය හැක්කේ එක් අයෙකුට පමණි.
- සමූහ වාදනය සඳහා උපරිම සහභාගීත්වය 10 කි.

## 05. <u>නර්තන අංග සඳහා කාලය.</u>

- ඒකල සහ යුගල තරග සඳහා උපරිම කාලය විනාඩි 05 කි.
- **සමූහ තරග සඳහා** සඳහා උපරිම කාලය විනාඩි 06 කි.
- මුද්‍රා නාට්‍ය සඳහා උපරිම කාලය විනාඩි 10 කි.
- අමතර සමා කාලය තත්පර 45 කි.

## 06. වෙනත් උපදෙස්

- යම් තරග කරුවෙකු කලාප නර්තන තරගය සඳහා ඉදිරිපත්වී ජයග්‍රහණය කළ පසු වෙනත් පාසලකට ඇතුළත් වුවහොත් අදාල වර්ෂයේ පළාත් සහ සමස්ත ලංකා තරග සඳහා ඉදිරිපත් විය හැක්කේ කලාප තරග සඳහා නියෝජනය කළ පාසලෙන් පමණි.
- රංග භාණ්ඩ සීමා නොකෙරේ.
- මුද්‍රා නාට්‍ය අංග හැර සියළුම නර්තන අංග සඳහා වේදිකාවේදී පසුතල භාවිතා නොකළ යුතුය. මුද්‍රා නාට්‍ය සඳහා පසුතල නිර්මාණය කිරීමේදී පාසල් වේදිකා පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

## 07. තරග පැවැත්වීම.

කලාප තරග 2019 මාර්තු 30 වන දිනට ප්‍රථමද, පළාත් තරග 2019 අප්‍රේල් 30 වන දිනට ප්‍රථම ද පවත්වා අවසන් කළ යුතුය. අවසන් තරගය 2019 ජූනි මස 01 සහ 02 දිනයන්හිදී පැවැත්වෙන බැවින් පළාත් තරග ප්‍රතිපල ලේඛණය 2019 මැයි 10 වන දිනට ප්‍රථම අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාල දිනට ප්‍රථම ප්‍රතිපල එවනු නොලබන පළාත් අවසන් මහා තරගයට සහභාගී නොවන පළාතක් ලෙස කටයුතු කරනු ලැබේ.

## 08 . අධීක්ෂණය.

කලාප හෝ පළාත් තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරියෙකුට හා කලාප තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අදාල පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන නිළධාරියෙකුට සහභාගී විය හැකිය.

## 09. විනිශ්චය පිළිගැනීම.

විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තිරණය වේ. විනිශ්චයෙන් පසු විනිශ්චය මණ්ඩලය පිළිබඳව පසු විපරම් කිරීම සපුරා තහනම්ය. විනිශ්චය මණ්ඩලය හෝ සංවිධායක මණ්ඩලය පිළිබඳ විවේචනය කිරීම තහනම් වන අතර, නර්තන ගුරු භවතුන් මේ පිළිබඳව වඩාත් සැළකිළිමත් විය යුතුය.විනය කඩ කිරීමක් සිදුවුවහොත් අදාල පාසල වෙනුවෙන් විනය ක්‍රියා මාර්ග ගන්නා බව දන්වන අතර, ජයග්‍රහණය ලබා ඇත් නම් එය අවලංගු කිරීමට ද හේතු වනු ඇත.

තරග මධ්‍යස්ථාන භූමියතුළ විනය කඩ කිරීම් සිදුවන ලෙස හැසිරීම් නොකල යුතුය. ජය පරාජය සම සිතින් විඳදරා ගැනීමට දරුවන් පුරුදු කළ යුතුය.තරග මධ්‍යස්ථානවලට ඇතුල් වීමට අවසර ඇත්තේ අදාල පාසලේ විදුහල්පති ට,ගුරු භවතුන් ට හා නර්තනය සඳහා සහභාගීවන්නන් ට පමණි. නිර්නාමික ලිපි අභියාචනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාල විද්‍යාලයේ විදුහල්පති සහ නර්තන ගුරුභවතා වගකිව යුතුය. යම් ලිපියක් ඉදිරිපත් කරන්නේ නම් අදාල විද්‍යාලයේ විදුහල්පති මගින් ඉදිරිපත් කළ යුතුය.

10. තරග සම්බන්ධයෙන් යම් ගැටළුවක් මතුවුවහොත් සෞන්දර්ය අධ්‍යක්ෂකගේ නිර්දේශ මත අධ්‍යාපන ලේකම් විසින් අවසාන තීරණය දෙනු ලැබේ.

## 11. අයදුම් පත් යොමු කිරීම.

තරගය සඳහා ඉදිරිපත්වීමේදී අදාල චක්‍ර ලේඛයේ අංක 02 ඇමුණුම අනුව සකස් කරන ලද අයදුම් පත භාවිතා කල යුතුය. සහභාගීවන සෑම ශිෂ්‍යයෙක්ම විදුහල්පති ඉදිරියේ එක් තීරුවක අත්සන් කල යුතු අතර, අනෙක් තීරුව තරග සංවිධාන මණ්ඩලයේ අත්සන් කිරීමට ඉඩ තැබිය යුතුය.

විදුහල්පති විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්ද, 06 – 09 ශ්‍රේණි සඳහා විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක්ද,10 – 13 වසර දක්වා සිසුන් වලංගු හැඳුනුම්පතක්ද ඉදිරිපත් කළ යුතුය.

12. අවසාන තරගයේදී සංවිධායක මණ්ඩලයේ උපදෙස් හා අවසරය මත <u>තම පාසලේ නර්තන අංගය පමණක්</u> ජංගම දුරකථනයක් මගින් වීඩියෝ ගත කිරීමට තම පාසලේ එක් ගුරුභවතෙකුට අවස්ථාවක් ඇත.එහෙත් එම වීඩියෝ දර්ශන විනිශ්චය හෝ අභියාචනය සඳහා කිසිදු අවස්තාවක භාවිතා නොකළ යුතුය.

13. තරගය සඳහා සහභාගීවන්නන් තම පාසලේ අනන්‍යතාවය තහවුරුවන කිසිවක් ප්‍රදර්ශණය නොකිරීමට වග බලා ගත යුතුය.

14. සමස්ත නර්තන තරගාවලියේදීම නර්තන විෂයෙහි ගුණාත්මක බව ආරක්ෂාවීම සඳහා එහි ඇති සාරධර්ම ආරක්ෂාවන පරිදි කටයුතු කිරීමට තම සිසුන් තුළ ආකල්ප සංවර්ධනය කළ යුතුය.(උදා- අන්‍යයන්ට, වේදිකාවට, වාද්‍ය භාණ්ඩවලට ගරු කිරීම, පාවහන් ගලවා බෙරවාදනය, ආචාර සමාචාර කිරීම, ඉවසීම ආදි ගුණාංග)

<u>පොදු උපදෙස්</u>

- රජයේ පාසල්/ අනුමත පාසල්/ පිරිවෙන් විද්‍යායතන සඳහා සමූහ තරග දෙකක් හා ඒකල තරග එකක් බැගින් තරග අංග තුනක් තෝරාගත හැකිය.
- සමූහ තරග අංග තෝරා ගැනීමේදී එක් කාණ්ඩයකින් (A කාණ්ඩය,B කාණ්ඩය) එක බැගින් තෝරා ගත යුතු අතර එක් කාණ්ඩයකින් පමණක් තරග ශීර්ෂ තෝරා නොගත යුතුය.(300 ට අඩු තරග ශීර්ෂ සඳහා මෙම කොන්දේසිය අදාල නොවේ)
- තරග අංග දෙකක් පමණක් තෝරා ගන්නේ නම් ඉදිරිපත් කරන තරග අංග වලින් අවම වශයෙන් එක් අංගයක්වත් සමූහ අංගයක් විය යුතුය.
- 300 ට අඩු පාසල් තරග අංග දෙකකට පමණක් ඉදිරිපත් වන්නේ නම් ඒකල තරග දෙකකට වුවද ඉදිරිපත් විය හැකිය.
- 300 ට අඩු පාසල් තරග තුනකට ඉදිරිපත් වන්නේ නම් එය, සමූහ අංග දෙකක් සහ ඒකල අංග එකකින් හෝ ඒකල අංග දෙකක් හා සමූහ අංග එකකින් සමන්විත විය යුතුය.

- 1000 ට වැඩි පාසල්වල සියළුම තරග සඳහා වාදනය සිසුන් විසින්ම ඉදිරිපත් කළ යුතුය. අනෙකුත් පාසල් සඳහා මෙම කොන්දේසිය අදාල නොවන අතර ගුරුභවතුන්ටද වාදනය කළ හැක.
- ශිෂ්‍ය සංඛ්‍යාව 1000 ට වැඩි පාසල්වල සියළුම පිරිමි තරග ශීර්ෂ සඳහා පිරිමි ළමුන්ද, ගැහැණු තරග ශීර්ෂ සඳහා ගැහැණු ළමුන්ද, මිශ්‍ර තරග සඳහා ගැහැණු පිරිමි මිශ්‍රව ද වාදනයෙන් සහාය විය යුතුය.
- ශිෂ්‍ය සංඛ්‍යාව 1000 ට වැඩි පාසල් මිශ්‍ර තරග සඳහා බෙර වාදනයේදී ද, ගායනයේදී ද ගැහැණු පිරිමි සමාන විය යුතුය. මුද්‍රා නාට්‍ය සඳහා මෙම කොන්දේසිය අදාල නොවේ.
- සියළුම නර්තන තරග සඳහා සහාය ගායනයේදී පිරිමි තරග වලදී පිරිමි ළමුන්ද ,ගැහැණු තරග වලදී ගැහැණු ළමුන්ද, මිශ්‍ර තරග වලදී සමානව මිශ්‍ර වශයෙන්ද සහභාගීවීම අනිවාර්ය වේ.
- මිශ්‍ර තරගයන්හි නර්තනය සඳහා ගැහණු පිරිමි සමාන වීම අත්‍යාවශ්‍ය නොවන අතර, එක් වර්ගයකින් අවම වශයෙන් 03 දෙනෙක්වත් සහභාගී වියයුතුය.
- සියළුම වාදනයට සහභාගීවන්නන් අදාල පාසලේම අය විය යුතුය.
- ජාත්‍යන්තර පාසල් සඳහා පැවැත්වෙන තරගය ජාත්‍යන්තර පාසල් අතර පමණක් පැවැත්වෙන අතර සහභාගි විය හැකි උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව 02 කි.
- කලාප තරග පළාත් තරග හා සමස්ත ලංකා අවසන් තරගය සඳහා පුහුණුවීම් ඇඳුම් කට්ටලය පමණක් භාවිතා කිරීම අනිවාර්ය වේ.
- ගායනයෙන් සහ නර්තනයෙන් සහභාගීවන දී සියළුම සිසුන් තම පාසලේ අදාල ශ්‍රේණි වල ඉගෙන ගන්නා සිසුන් විය යුතුය.
- මුද්‍රා නාට්‍ය සඳහා සහාය වාදනයේදී ගැහැණු පිරිමි සමාන වීමද, ගැහැණු පිරිමි වශයෙන් වෙන්කිරීමක් අවශ්‍ය නැත. (සිසුන් 1000 ට වැඩි පාසල් වල ගුරුභවතුන්ට වාදනය කල නොහැක)

සිසුන් 1000 ට අඩු පාසල්

## A කාණ්ඩය

### 6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 01 | ගැහැණු | සමූහ | උඩරට | නෛයඩි වන්නම |
| තරග අංකය | 02 | පිරිමි | සමූහ | උඩරට | නෛර්ත වන්නම |
| තරග අංකය | 03 | මිශ්‍ර | සමූහ | උඩරට | ගණපති වන්නම |
| තරග අංකය | 04 | ගැහැණු | සමූහ | පහතරට | සරල කවි තාල (මහතනිතිත) |
| තරග අංකය | 05 | පිරිමි | සමූහ | පහතරට | සරල කවි තාල (මැදුම් තනි තිත) |
| තරග අංකය | 06 | මිශ්‍ර | සමූහ | පහතරට | කවි තාල (මැදුම් මහ දෙතිත) |
| තරග අංකය | 07 | ගැහැණු | සමූහ | සබරගමු | කදම්භ පක්ෂි වන්නම |
| තරග අංකය | 08 | පිරිමි | සමූහ | සබරගමු | ආනන්ද වන්නම |
| තරග අංකය | 09 | මිශ්‍ර | සමූහ | සබරගමු | තිසරා වන්නම |
| තරග අංකය | 10 | ගැහැණු | සමූහ | කුළු මොල්ගස් නැටුම | |
| තරග අංකය | 11 | පිරිමි | සමූහ | පතුරු සහ ලී කෙළි නැටුම්වල සම්මිශ්‍රණයක් | |
| තරග අංකය | 12 | මිශ්‍ර | සමූහ | ගොයම් (කුඹුරු කෙටීම සිට ගොයම් කැපීම දක්වා) | |

### 6-13 ශ්‍රේණි සඳහා මුද්‍රා නාට්‍ය

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 13 | ගැහැණු | සමූහ | ගැමි සමාජයේ මානවීය ගුණාංග නාගරික සමාජයේදී බිඳ වැටේ තේමාව ඇසුරින් |
| තරග අංකය | 14 | පිරිමි | සමූහ | සිරිත් විරිත් හා සමාජ යහපැවැත්ම යන තේමාව ඇසුරින් |
| තරග අංකය | 15 | මිශ්‍ර | සමූහ | අන්‍ය ආගම්වලට ගරු කරමු යන තේමාව ඇසුරින් |

## B කාණ්ඩය

### 10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 16 | ගැහැණු | සමූහ | උඩරට | මයුරා වන්නම |
| තරග අංකය | 17 | පිරිමි | සමූහ | උඩරට | යක්තුන්පදය |
| තරග අංකය | 18 | මිශ්‍ර | සමූහ | උඩරට | අස්නය |
| තරග අංකය | 19 | ගැහැණු | සමූහ | පහතරට | ශුද්ධ මාත්‍රය |
| තරග අංකය | 20 | පිරිමි | සමූහ | පහතරට | තෙල්මේ |
| තරග අංකය | 21 | මිශ්‍ර | සමූහ | පහතරට | වඩිගපටුන |
| තරග අංකය | 22 | ගැහැණු | සමූහ | සබරගමු | පත්තිනි මල්අස්න |
| තරග අංකය | 23 | පිරිමි | සමූහ | සබරගමු | දළුමුර පාලිය |
| තරග අංකය | 24 | මිශ්‍ර | සමූහ | සබරගමු | සින්දු මාත්‍රය |
| තරග අංකය | 25 | පිරිමි | සමූහ | පතල් කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 26 | ගැහැණු | සමූහ | පේෂ කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 27 | මිශ්‍ර | සමූහ | ධීවර කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 28 | ගැහැණු | සමූහ | දේශීය වාද්‍ය භාණ්ඩ ඇසුරින් නිර්මාණාත්මක සමූහ වාදනයක් | |
| තරග අංකය | 29 | පිරිමි | සමූහ | දවුල, තම්මැට්ටම (දඬු බෙරය සහිත), හොරණෑව ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් | |
| තරග අංකය | 30 | මිශ්‍ර | සමූහ | ගැටබෙරය, පහතරට බෙරය,දවුල ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් | |

10,11,12,13 ශ්‍රේණිසඳහා චරිත නිරූපන (නර්තන මාධ්‍යයෙන් )

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 31 | ගැහැණු | ඒකල | මැණික්පාල බිසව |
| තරග අංකය | 32 | පිරිමි | ඒකල | රාවණ රජතුමා |
| තරග අංකය | 33 | යුගල | යුගල | රාධා හා ක්‍රිෂ්ණ |

## ඒකල තරග ශීර්ෂ
(මෙම තරග අංග කාණ්ඩ ගත නොකෙරේ)

6,7,8,9 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 34 | ගැහැණු | ඒකල | උඩරට | කිරලා වන්නම |
| තරග අංකය | 35 | පිරිමි | ඒකල | උඩරට | තුරඟා වන්නම |
| තරග අංකය | 36 | ගැහැණු | ඒකල | පහතරට | සරල කවිතාල (3/4, 2/2 ,3/3) |
| තරග අංකය | 37 | පිරිමි | ඒකල | පහතරට | සරල කවිතාල (3/4, 2/2,3/3) |
| තරග අංකය | 38 | ගැහැණු | ඒකල | සබරගමු | තැඹිලි පාලිය |
| තරග අංකය | 39 | පිරිමි | ඒකල | සබරගමු | යක්පද මාත්‍රය |

10,11,12,13 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 40 | ගැහැණු | ඒකල | උඩරට | වීරමුණ්ඩ දෙවි හා කොහොඹා දෙවි කෝල්මුර ඇසුරින් නර්තනයක් |
| තරග අංකය | 41 | පිරිමි | ඒකල | උඩරට | පොල් පදය |
| තරග අංකය | 42 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි මල්අස්න |
| තරග අංකය | 43 | පිරිමි | ඒකල | පහතරට | නානුමුරය (රට යකුම -වාචික දෙබස් රහිතව) |
| තරග අංකය | 44 | ගැහැණු | ඒකල | සබරගමු | පට්වුතාල මාත්‍රය |
| තරග අංකය | 45 | පිරිමි | ඒකල | සබරගමු | බිල්ලෙ පාලිය |

10,11,12,13 ශ්‍රේණි සඳහා ඒකල බෙර වාදන

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 46 | ගැහැණු | ඒකල | උඩරට | මගුල් බෙර (1.2.3 වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 47 | පිරිමි | ඒකල | උඩරට | මගුල් බෙර (2.3.4 වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 48 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි සවුදම ඇසුරින් |
| තරග අංකය | 49 | පිරිමි | ඒකල | පහතරට | පත්තිනි සවුදම ඇසුරින් |
| තරග අංකය | | ගැහැණු | ඒකල | සබරගමු | මූලික දවුල් පද හා අලංකාර පද ඇසුරු කර ගත් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 50 | පිරිමි | ඒකල | සබරගමු | විවිධ තාල රූප වලට අයත් ග්‍රහපන්ති ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් (තාල රූප 3 මෙන්ම ගායනා සහිත වාදනයක් විය යුතුයි) |

## සිසුන් 1000 ට වැඩි පාසල්

### A කාණ්ඩය

**6,7,8,9 ශ්‍රේණි සඳහා සමූහ තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 51 | ගැහැණු | සමූහ | උඩරට | නෛයඩි වන්නම |
| තරග අංකය | 52 | පිරිමි | සමූහ | උඩරට | නෛර්ත වන්නම |
| තරග අංකය | 53 | මිශ්‍ර | සමූහ | උඩරට | ගණපති වන්නම |
| තරග අංකය | 54 | ගැහැණු | සමූහ | පහතරට | සරල කවි තාල (මහතනිතිත) |
| තරග අංකය | 55 | පිරිමි | සමූහ | පහතරට | සරල කවි තාල (මැදුම් තනි තිත) |
| තරග අංකය | 56 | මිශ්‍ර | සමූහ | පහතරට | කවි තාල (මැදුම් මහ දෙතිත) |
| තරග අංකය | 57 | ගැහැණු | සමූහ | සබරගමු | කදම්භ පක්ෂි වන්නම |
| තරග අංකය | 58 | පිරිමි | සමූහ | සබරගමු | ආනන්ද වන්නම |
| තරග අංකය | 59 | මිශ්‍ර | සමූහ | සබරගමු | තිසරා වන්නම |
| තරග අංකය | 60 | ගැහැණු | සමූහ | කුළු මොල්ගස් නැටුම | |
| තරග අංකය | 61 | පිරිමි | සමූහ | පතුරු සහ ලී කෙළි නැටුම්වල සම් මිශ්‍රණයක් | |
| තරග අංකය | 62 | මිශ්‍ර | සමූහ | ගොයම් (කුඹුරු කෙටීම සිට ගොයම් කැපීම දක්වා) | |

**6-13 ශ්‍රේණි සඳහා මුද්‍රානාට්‍ය**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 63 | ගැහැණු | සමූහ | ගැමි සමාජයේ මානවීය ගුණාංග නාගරික සමාජයේදී බිඳ වැටේ තේමාව ඇසුරින් |
| තරග අංකය | 64 | පිරිමි | සමූහ | සිරිත් විරිත් හා සමාජ යහපැවැත්ම යන තේමාව ඇසුරින් |
| තරග අංකය | 65 | මිශ්‍ර | සමූහ | අන්‍ය ආගම්වලට ගරු කරමු යන තේමාව ඇසුරින් |

### B කාණ්ඩය

**10,11,12,13 ශ්‍රේණි සඳහා සමූහ තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 66 | ගැහැණු | සමූහ | උඩරට | මයුරා වන්නම |
| තරග අංකය | 67 | පිරිමි | සමූහ | උඩරට | යක් තුන්පදය |
| තරග අංකය | 68 | මිශ්‍ර | සමූහ | උඩරට | අස්නය |
| තරග අංකය | 69 | ගැහැණු | සමූහ | පහතරට | ශුද්ධ මාත්‍රය |
| තරග අංකය | 70 | පිරිමි | සමූහ | පහතරට | තෙල්මේ |
| තරග අංකය | 71 | මිශ්‍ර | සමූහ | පහතරට | වඩිගපටුන |
| තරග අංකය | 72 | ගැහැණු | සමූහ | සබරගමු | පත්තිනි මල්අස්න |
| තරග අංකය | 73 | පිරිමි | සමූහ | සබරගමු | දළුමුර පාලිය |
| තරග අංකය | 74 | මිශ්‍ර | සමූහ | සබරගමු | සිංදු මාත්‍රය |
| තරග අංකය | 75 | පිරිමි | සමූහ | පතල් කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 76 | ගැහැණු | සමූහ | පේෂ කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 77 | මිශ්‍ර | සමූහ | ධීවර කර්මාන්තය ඇසුරින් නර්තන නිර්මාණයක් | |
| තරග අංකය | 78 | ගැහැණු | සමූහ | දේශීය වාද්‍ය භාණ්ඩ ඇසුරින් නිර්මාණාත්මක සමූහ වාදනයක් | |
| තරග අංකය | 79 | පිරිමි | සමූහ | දවුල, තම්මැට්ටම (දඬු බෙරය සහිත),හොරණෑව ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් | |
| තරග අංකය | 80 | මිශ්‍ර | සමූහ | ගැටබෙරය, පහතරට බෙරය,දවුල ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් | |
| තරග අංකය | 81 | ගැහැණු | ඒකල | මැණික්පාල බිසව | |
| තරග අංකය | 82 | පිරිමි | ඒකල | රාවණ රජතුමා | |
| තරග අංකය | 83 | යුගල | යුගල | රාධා හා ක්‍රිෂ්ණ | |

## ඒකල තරග ශීර්ෂ - ( මෙම තරග අංග කාණ්ඩ ගත නොකෙරේ )

### 6,7,8,9 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 84 | ගැහැණු | ඒකල | උඩරට | කිරලා වන්නම |
| තරග අංකය | 85 | පිරිමි | ඒකල | උඩරට | තුරඟා වන්නම |
| තරග අංකය | 86 | ගැහැණු | ඒකල | පහතරට | සරල කවිතාල (3/4, 2/2 ,3/3) |
| තරග අංකය | 87 | පිරිමි | ඒකල | පහතරට | සරල කවිතාල (3/4, 2/2,3/3) |
| තරග අංකය | 88 | ගැහැණු | ඒකල | සබරගමු | තැඹිලි පාලිය |
| තරග අංකය | 89 | පිරිමි | ඒකල | සබරගමු | යක්පද මාත්‍රය |

### 10,11,12,13 ශ්‍රේණි සඳහා ඒකල තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 90 | ගැහැණු | ඒකල | උඩරට | වීරමුණ්ඩ දෙවි හා කොහොඹා දෙවි කෝල්මුර ඇසුරින් නර්තනයක් |
| තරග අංකය | 91 | පිරිමි | ඒකල | උඩරට | පොල් පදය |
| තරග අංකය | 92 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි මල්අස්න |
| තරග අංකය | 93 | පිරිමි | ඒකල | පහතරට | නානුමුරය (රට යකුම -වාචික දෙබස් රහිතව) |
| තරග අංකය | 94 | ගැහැණු | ඒකල | සබරගමු | පට්ටුතල් මාත්‍රය |
| තරග අංකය | 95 | පිරිමි | ඒකල | සබරගමු | බිල්ලෙ පාලිය |

### 10,11,12,13 ශ්‍රේණි සඳහා ඒකල බෙර වාදන

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 96 | ගැහැණු | ඒකල | උඩරට | මගුල් බෙර (1.2.3 වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 97 | පිරිමි | ඒකල | උඩරට | මගුල් බෙර (2.3.4 වට්ටම් ඇසුරින්) |
| තරග අංකය | 98 | ගැහැණු | ඒකල | පහතරට | පත්තිනි සවුදම ඇසුරින් |
| තරග අංකය | 99 | පිරිමි | ඒකල | පහතරට | පත්තිනි සවුදම ඇසුරින් |
| තරග අංකය | 100 | ගැහැණු | ඒකල | සබරගමු | මූලික දවුල් පද හා අලංකාර පද ඇසුරු කර ගත් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 101 | පිරිමි | ඒකල | සබරගමු | විවිධ තාල රූප වලට අයත් ග්‍රහපන්ති ඇසුරින් නිර්මාණාත්මක වාදනයක් (තාල රූප 3 මෙන්ම ගායනා සහිත වාදනයක් විය යුතුයි) |

<u>**සිසුන් 300 ට අඩු පාසල් සඳහා පමණි**</u>

**(12-13 ශ්‍රේණි පමණක් සෞන්දර්ය විෂයන් පවතින පාසල් මේ සඳහා ඉල්ලුම් කළ නොහැක)**

### 06 -13 ශ්‍රේණි සඳහා සමූහ තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 102 | ගැහැණු | සමූහ | උඩරට | උරගා වන්නම |
| තරග අංකය | 103 | පිරිමි | සමූහ | උඩරට | වෛරොඩි වන්නම |
| තරග අංකය | 104 | මිශ්‍ර | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 105 | ගැහැණු | සමූහ | පහතරට | සුරඹාවල්ලිය |
| තරග අංකය | 106 | පිරිමි | සමූහ | පහතරට | වඩිග පටුන |
| තරග අංකය | 107 | මිශ්‍ර | සමූහ | පහතරට | යහන් දැක්ම |
| තරග අංකය | 108 | ගැහැණු | සමූහ | සබරගමු | කොවුලා වන්නම |
| තරග අංකය | 109 | පිරිමි | සමූහ | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 110 | මිශ්‍ර | සමූහ | සබරගමු | මල්පදය |
| තරග අංකය | 111 | ගැහැණු | සමූහ | චාමර | |
| තරග අංකය | 112 | පිරිමි | සමූහ | ලී කෙළි | |
| තරග අංකය | 113 | මිශ්‍ර | සමූහ | සවරං | |

සැළකිය යුතුය - ඒකල තරග වලදී 300 ට අඩු පාසල් 1000 ට අඩු පාසල් යටතේ තරග කළ යුතුය.

## ජාත්‍යන්තර / පෞද්ගලික පාසල් සඳහා තරග ශීර්ෂ

එක් පාසලකින් තරග ශීර්ෂ 02 කට පමණක් සහභාගී විය හැකිය.

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 114 | ගැහැණු | සමූහ | උඩරට | ගාහක වන්නම |
| තරග අංකය | 115 | පිරිමි | සමූහ | උඩරට | මධුපුරය සහිත මල්හත්පදය |
| තරග අංකය | 116 | ගැහැණු | සමූහ | පහතරට | ගිරිදේවි |
| තරග අංකය | 117 | පිරිමි | සමූහ | පහතරට | දෙවොල් |
| තරග අංකය | 118 | ගැහැණු | සමූහ | සබරගමු | සිංදු මාත්‍රය |
| තරග අංකය | 119 | පිරිමි | සමූහ | සබරගමු | තැඹිළි පාලිය |

මෙම තරගය සඳහා ඉදිරිපත්වන සියළු ම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවකම තරග චක්‍රලේඛයේ සඳහන් සියලු නීති රීති පිළිපැදීමටත්,විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතුය.සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශනය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතුය.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම් අංක 01

සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2019 - ඇගයීම් නිර්ණායක

සාම්ප්‍රදායික - ඒකල තරග ( උඩරට /පහතරට/සබරගමු )

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව ආරක්ෂාවීම සහ ශාස්ත්‍රීය බව | 30 |
| 02 | වාදනය /ගායනය සුසංයෝගී බව | 30 |
| 03 | රංග වින්‍යාසය,ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා ,සමස්ත නිමාව | 35 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

සාම්ප්‍රදායික - සමූහ තරග ( උඩරට /පහතරට/සබරගමු )

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව ආරක්ෂාවීම සහ ශාස්ත්‍රීය බව | 30 |
| 02 | වාදනය /ගායනය සුසංයෝගී බව සහ සාමූහික බව | 30 |
| 03 | රංග වින්‍යාසය,ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා ,සමස්ත නිමාව | 35 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

සාම්ප්‍රදායික - ඒකල වාදනය ( උඩරට /පහතරට/සබරගමු )

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව ආරක්ෂාවීම සහ ශාස්ත්‍රීය බව | 45 |
| 03 | ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා ,වාදන ශිල්පක්‍රම සහ සමස්ත නිමාව | 50 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

සමූහ වාදන තරග

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සාම්ප්‍රදායික බව ආරක්ෂාවීම /නිර්මාණශීලි බව | 45 |
| 02 | වාදනය සුසංයෝගී බව, ප්‍රසාංගික බව,සිසු ශක්‍යතා ,වාදන ශිල්ප ක්‍රම | 50 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

නිර්මාණ නර්තන /ගැමි

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවට උචිත බව, නිර්මාණ ශිලි බව, | 25 |
| 02 | ගායන, වාදන, රංග භාණ්ඩ සුසංයෝජනය | 30 |
| 03 | සිසු ශක්‍යතා ,ප්‍රසාංගික බව ,සමස්ත නිමාව | 40 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

මුද්‍රා නාට්‍ය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තේමාවේ තීව්‍ර බව, නිර්මාණශීලි බව, | 30 |
| 02 | පසුතල, රංග භාණ්ඩ, වාදන යනාදියෙහි සුසංයෝජනය | 30 |
| 03 | සිසු ශක්‍යතා , ප්‍රසාංගික බව ,සමස්ත නිමාව | 35 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

චරිත නිරූපණය

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | චරිතය ගලපා ගැනීම, නිර්මාණ ශීලිබව | 45 |
| 03 | භාව ප්‍රකාශය | 50 |
| 04 | රංග වස්ත්‍රාභරණ | 05 |

ඇමුණුම 02

## සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 20....

01.පාසල අයත් කලාපය -................................................ පළාත - ..............................................

02.පාසලේ නම සහ ලිපිනය -..................................................................
..................................................................
..................................................................

03.පාසලේ දුරකථන අංකය -.......................................

| තරඟ ශීර්ෂ අංකය | තරඟයේ නම |
|---|---|
| | |

| අනු අංක | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | උපන්දිනය | ඉගෙන ගන්නා ශ්‍රේණිය | විදුහල්පති ඉදිරියේ අත්සන | තරඟ මණ්ඩලය ඉදිරියේ අත්සන |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |
| 05 | | | | | |
| 06 | | | | | |
| 07 | | | | | |
| 08 | | | | | |
| 09 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |
| 13 | | | | | |
| 14 | | | | | |
| 15 | | | | | |
| 16 | | | | | |

ගායනය සඳහා සහභාගී වන්නන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

වාදනය සඳහා සහභාගී වන්නන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

ප්‍රසංග අංග පුහුණු කල ගුරුභවතුන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |
| 03 | | | | | |
| 04 | | | | | |

ඉහත සඳහන් සිසුන් අප විද්‍යාලයේ අදාල ශ්‍රේණි වල ඉගෙන ගන්නා බවත්, අප විද්‍යාලය ශිෂ්‍ය සංඛ්‍යාව අනුව 1000 වැඩි/අඩු පාසලක් බවත් ,චක්‍ර ලේඛය අනුව අදාල සිසුන් මා ඉදිරියේ අත්සන් කළ බවත් , චක්‍ර ලේඛයේ සදහන් කරුණු වලට අනුව තරගය සදහා ඉදිරිපත් කිරීම නිර්දේශ කරමි.

විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය</u>

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
නිලමුද්‍රාව

ඇමුණුම 03

## සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 20......

**ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම** - ..............................................................................

**පාසල** -......................................................................................................

**උපන් දිනය** -............................................................................................

**ඉගෙනුම ලබන ශ්‍රේණිය** -.......................................................................

**ඡායාරූප සහතික කිරීම.**

**ඡායාරූපය මත අත්සන්කර විදුහල්පතිගේ නිලමුද්‍රාව තබන්න**

**ඉහත සඳහන් ශිෂ්‍ය/ ශිෂ්‍යාව අප විද්‍යාලයේ ඉගෙනුම ලබන බව සහතික කරමි.**